--

# බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව


පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

මානව ශාස්ත්‍ර පීඨය

කැලණිය විශ්වවිද්‍යාලය


**පාඨමාලා සම්බන්ධීකාරක**


ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වලස්මුල්ලේ හද්දිය හිමි **(ඉංග්‍රීසි මාධ්‍යය)** 0718605582

කථිකාචාර්ය ශ්‍රියානි හේමලතා මිය **(සිංහල මාධ්‍යය)** 0714621037


**පාඨමාලා සහායක**


තරිනි සස්මිතා සුදුසිංහ මිය - 0701553528

# බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

# කැලණිය විශ්වවිද්‍යාලය

## කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ ප්‍රධාන හා කීර්තිමත් විශ්වවිද්‍යාලයක් වන කැලණිය විශ්වවිද්‍යාලය 1875 වර්ෂයේ දී භික්ෂු අධ්‍යාපනය සඳහා කේන්ද්‍රස්ථානයක් ව පැවති විද්‍යාලංකාර පිරිවෙන මුල්කොට ගෙන බිහිවූවකි. එය 1959 වර්ෂයේ දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය තත්වයට පත් කරන ලදුව 1978 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලය නමින් හඳුන්වන ලදී. එහි මානව ශාස්ත්‍ර පීඨයට අයත් පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය විසින් එදා මෙදා තුර අනුරාධපුර මහාවිහාරය මූලික කොටගත් බෞද්ධ අධ්‍යාපනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම උදෙසා කරන ලද සේවාව අනල්ප වේ. කැලණිය විශ්වවිද්‍යාලයේ පැරණිම අධ්‍යයනාංශය වන පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය ශාස්ත්‍රීය දායකත්වය තුළින් මෙන්ම දේශීය විදේශීය උගතුන් දහස් ගණනක් බිහි කිරීමෙන් හා විදේශීය සබඳතා නිසා කීර්තිමත් තත්වයකට පත්ව ඇත. මෙම අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන පශ්චාත් උපාධි අපේක්ෂකයෙකු වශයෙන් ඔබ කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජිකත්වය ලබා ගැනීම පිළිබඳව ප්‍රහර්ෂයට පත්වෙමු.

## පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය කැලණිය විශ්වවිද්‍යාලයේ දැනට පැරණිම අධ්‍යයනාංශයක් වන අතර ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි බෞද්ධ අධ්‍යයනය සම්බන්ධයෙන් කීර්තිමත් ම අධ්‍යයනාංශයක් බව කිව යුතුය. පාලි, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ දර්ශනය හා බෞද්ධ මනෝවිද්‍යාව යන විෂය ධාරාවන් මූලික කොට ගත් තදනුබද්ධ ජ්‍යොතිෂය, උපදේශනය, කළමණාකරණය හා ආයුර්වේදය යනාදී පැතිකඩ ඔස්සේ ද ඩිප්ලෝමා, ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රපති, දර්ශනපති හා දර්ශන විශාරද උපාධිය දක්වා ම මෙහි හැදෑරීම් කටයුතු සිදුවෙමින් පවතී. දේශීය විදේශීය සිසුන් සඳහා සිංහල ඉංග්‍රීසි මාධ්‍ය දෙකෙන්ම දේශන පැවැත්වෙන අතර බාහිර සිසුන් සඳහා ද පහසුකම් රාශියක් සැලසී ඇත. වාර්ෂිකව පාලි, බෞද්ධ සංස්කෘතිය හා බෞද්ධ දර්ශනය හා බෞද්ධ මනෝවිද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් සිය ගණනක් බාහිර ශිෂ්‍යයන් විසින් ශාස්ත්‍රවේදී උපාධිය හිමිකර ගනු ලබන අතර, ඩිප්ලෝමා හා එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවක් පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය හා අනුබද්ධ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය මගින් පවත්වා ගෙන යනු ලැබේ. මෙම අධ්‍යයනාංශය මගින් බාහිර සිසුන් සඳහා හඳුන්වා දෙනු ලබන නවතම පශ්චාත් උපාධි පාඨමාලාව වන්නේ මෙම දෑ අවුරුදු බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවයි.

## අරමුණ

බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පර්යේෂණාත්මක හැදෑරීම් කෙරෙහි අභිරුචියක් දක්වන විද්‍යාර්ථීන්ට සහාය වීමත්, මෙරට විශ්වවිද්‍යාලවලින් බිහි වන ශාස්ත්‍රවේදී උපාධිධාරීන් පර්යේෂණාත්මක අධ්‍යයන කෙරේ යොමු කිරීමත්, විවිධ තරාතිරමේ විද්‍යාර්ථීන්ගේ බුද්ධි ප්‍රසාරණය ඇති කිරීම හා බෞද්ධ අධ්‍යයන සම්බන්ධ දෑ අවුරුදු පශ්චාත් උපාධි පාඨමාලාවන්හි ඌනතාව මගහැරීමත් මෙහි අරමුණ වේ.

## ආරාධිත දේශකවරු

පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයෙහි නියුක්ත විවිධ විශ්වවිද්‍යාලයන්හි සේවයෙහි නියුක්ත අචාර්යවරුන් හා සේවාර්ජිත මහාචාර්යවරුන් හා ප්‍රසිද්ධ වෙනත් ආචාර්යවරුන් විසින් ද දේශන පවත්වනු ඇත.

## කාර්යමණ්ඩලය

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ සේවයෙහි නියුතු අනධ්‍යයන කාර්ය මණ්ඩලය දේශන පැවැත්වෙන දිනවල දී ඔබගේ සහායට ස්වකීය සේවය ලබාදෙනු ඇත.

## දේශන පැවැත්වෙන ස්ථානය

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ගොඩනැගිල්ලේ පිහිටි දේශන ශාලාවෙහි ශාස්ත්‍රපති උපාධිය සඳහා දේශන පැවැත්වීමට කටයුතු යොදා ඇත. විශේෂ අවස්ථාවක පමණක් වෙනත් සුදුසු ස්ථානයක ද මෙම දේශන පැවැත්විය හැකිය.

## දේශන පැවැත්වෙන කාලය

සෑම සෙනසුරාදා දිනකම පෙ.ව. 9.00 සිට 12.00 දක්වාත් පස්වරු 12.30 සිට 3.30 දක්වාත් දේශන පැවැත්වේ. නියමිත වෙලාවට පැමිණීම හා නියමිත වෙලාවට පෙර පිට ව යාමට උත්සාහ නොකිරීම ඔබගේ වගකීමක් ලෙස සැලකීම සුදුසු වන අතර, එම වගකීම නොසළකාහැරීම විද්‍යාර්ථීන් වශයෙන් ඔබට මෙන්ම සෙසු අයට ද හිරිහැරයක් වනු ඇත.

## පැමිණීම

අවම වශයෙන් 80%ක් වත් දේශන සඳහා පැමිණ තිබීම විශ්වවිද්‍යාලය මගින් අපේක්ෂා කෙරේ. ශිෂ්‍යත්ව ආදිය ප්‍රදානය කිරීම් වලදී ද පැමිණීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කෙරෙනු ඇත.

## නිවාඩු

නිවාඩු ලබා ගැනීම අවශ්‍ය කරන සේවා නියුක්ත විද්‍යාර්ථීන් පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයෙන් ලබා ගත් ආකෘති පත්‍රයක් පුරවා අංශයට බාරදීමෙන්, එදින ම හෝ ඊළඟ සතියේ දී අදාළ ලිපිය ලබා ගත හැකිය.

## පුස්තකාල හා වෙනත් පහසුකම්

ඔබගේ පුස්තකාල හැඳුනුම්පත පුස්තකාලයේ අදාළ නිලධාරියා වෙත ඉදිරිපත් කිරීමෙන් ඔබට පුස්තකාලය පරිහරණය කිරීමට හා පොත් බැහැර ගෙන යාමට අවශ්‍ය කාඩ්පත් ලබා ගත හැකිය. එම කාඩ්පත් සුරැකිව තබාගෙන පාඨමාලාව අවසානයේ ඒවා යළි බාර දුන් බවට සහතික ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

තේ සහ දිවා ආහාර විශ්වවිද්‍යාලයේ ආපන ශාලාවෙන් මිළ දී ගත හැකි අතර, කල්වේලා ඇතිව ඔබට අවශ්‍ය කෑම පාර්සල් ගණන දැනුම් දීම ආපනශාලාවට මෙන් ම ඔබට ද පහසුවක් වේ. යම් ආචාර්යවරයෙකු විසින් අත්පත්‍රිකා හෝ මුද්‍රිත දේශන ලබා දෙන්නේ නම් ඒවා අධ්‍යයනාංශය මගින් නොමිලේ ඡායා පිටපත් කර දෙනු ඇත.

## විභාග පැවැත්වීම

ශාස්ත්‍රපති උපාධිය සඳහා වන විභාගය පවත්වනු ලබන්නේ කැලණිය විශ්වවිද්‍යාලයේ විභාග අංශය මගිනි. විශේෂයෙන් පශ්චාත් උපාධි සම්බන්ධ සියලු කටයුතු මෙම විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මගින් සිදු කෙරේ. එබැවින් විභාග අයදුම්පත්, ලියාපදිංචි කිරීම් ආදී සියලු තොරතුරු විමසිය යුත්තේ එම පීඨයෙනි. එහි දුරකථන අංකය - 011 2903952

## අභියාචනා

වර්ෂාවසානයේ පැවැත්වෙන විභාගයට පෙනී සිටීමට හැකි සෑම උත්සාහයක්ම ගන්නා ලෙස අපි සියලු විද්‍යාර්ථීන්ට උපදෙස් දෙමු. නොවැළැක්විය හැකි යම් හේතුවක් නිසා විභාගයට පෙනී සිටීමට නොහැකි වුවහොත් ඊළඟ වර්ෂයේ විභාගයට පෙනී සිටීමට අභියාචනයක් සම්බන්ධීකාරකවරයාගේ උපදෙස් පරිදි පශ්චාත් උපාධි පීඨයේ පීඨාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. අසනීපයක් හේතුවෙන් විභාගයට පෙනී සිටීමට නොහැකි වූයේ නම් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ද අභියාචනය සමග

ඉදිරිපත් කළ යුතුය. වෙනත් කවර අභියාචනයක් වුවද ලිඛිත සාක්ෂි මගින් තහවුරු කළ යුතුය.

## විභාග ප්‍රතිඵල

අභ්‍යන්තර හා බාහිර පරීක්ෂවරු දෙදෙනෙකු විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔබගේ පිළිතුරු පත්වලට අදාළ ප්‍රතිඵල මාස 03 තරම් කාලයක් තුළ දී ලබා දීමට අප විසින් සෑම පියවරක්ම ගනු ලැබේ. එහෙත් මේ සඳහා මීට වඩා කල් ගත වන අවස්ථා ද ඇත. මේ සම්බන්ධයෙන් කෙරෙන විමසීම් විභාග අංශයෙන් කළ යුතු ය. පාඨමාලාව හැදෑරීමෙන් පසුව යම් විද්‍යාර්ථියෙකුට එම පාඨමාලාව හැදෑරූ බවට ලිපියක් අවශ්‍ය වේ නම්, එය පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයෙන් ලබා ගත හැකිය. සෑම ශිෂ්‍යයෙකුගේම ප්‍රතිඵල විභාග අංශයෙන් දැනගත හැකි වන අතර, ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු විශ්වවිද්‍යාලයෙන් ලබා ගත් අයදුම්පතක් නිසිපරිදි පුරවා බාර දීමෙන් පසු අදාළ සහතික පත්‍රය ලබා ගත හැකිය.

## උපාධි ප්‍රදානෝත්සවය

උපාධි ප්‍රදානෝත්සවය පිළිබඳ සියලු තොරතුරු විභාග අංශය මගින් ඔබ වෙත දන්වා එවනු ලැබේ. (විභාග අංශය : 011-2903114).

## (දෑවුරුදු සහ එක් අවුරුදු)

## බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

**පාඨමාලාවේ නම :** බෞද්ධ අධ්‍යයනය ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

**අධ්‍යයන කාල සීමාව:** වසර දෙකකි / වසර එකකි

**මාධ්‍යය :** සිංහල / ඉංග්‍රීසි

**පැවැත්වෙන දින :** සති අන්ත පාඨමාලාවකි (සෙනසුරාදා)

**ඇතුලත් වීමේ සුදුසුකම් :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රථම උපාධිය සමත් වී තිබීම.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් අනුමත කරන ලද උසස් අධ්‍යාපන ආයතනයක වසර තුනකට නො අඩු උපාධි පාඨමාලාවක් හදාරා ඉන් සාමර්ථ්‍යය ලබා තිබීම.

**හෝ**

ප්‍රාචීන පණ්ඩිත උපාධිය සමත් වී තිබීම.

**හෝ**

කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් අනුමත කරන ලද වෙනත් සුදුසුකම්.

**බඳවා ගැනීම් :**

අදාළ සුදුසුකම් සම්පූර්ණ කොට ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අදාළ නිර්ණායක යටතේ තෝරා ගනු ලබන අතර

විනය කාරණා ආදී අවශේෂ තත්වයන් ද සම්මුඛ පරීක්ෂක මණ්ඩලයේ විශේෂ අවධානයට යොමු වේ. එබඳු අවස්ථාවකදී සම්මුඛ පරීක්‍ෂක මණ්ඩලය මඟින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

**පාඨමාලා ව්‍යුහය :**

- ✓ **දෑ අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව** සඳහා අනිවාර්ය පාඨමාලා ඒකක ගණන 07 ක් වන අතර අධ්‍යයන සම්භාර ගණන 60 කි.
- ✓ **එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව** සඳහා අනිවාර්ය පාඨමාලා ඒකක ගණන 06 ක් වන අතර අධ්‍යයන සම්භාර ගණන 30 කි.

| | **පාඨමාලා ඒකකයේ නම** | **සංකේතාංකය** | **අධ්‍යයන සම්භාර ගණන** |
|---|---|---|---|
| 01 | පාලි ත්‍රිපිටක ධර්ම අධ්‍යයනය | MABS 53015 | 05 |
| 02 | බෞද්ධ මනෝවිද්‍යාව හා මනෝඋපදේශනය | MABS 53025 | 05 |
| 03 | බුදුසමය හා සමාජ ගැටලු | MABS 53035 | 05 |
| 04 | බුදුසමයේ ජාත්‍යන්තර ප්‍රවණතා | MABS 53045 | 05 |
| 05 | බෞද්ධ සාහිත්‍ය විචාරය | MABS 53055 | 05 |
| 06 | පර්යේෂණ ක්‍රමවේදය | MABS 53065 | 05 |
| 07 | පර්යේෂණ නිබන්ධිකාව | MABS 6306W | 30 |

## අරමුණු හා අභිමතාර්ථ :

මෙම පාඨමාලාවෙන් පාලි, ත්‍රිපිටක ධර්මය, බෞද්ධ මනෝවිද්‍යාව හා මනෝ උපදේශනය, බුදුසමය හා සමාජ ගැටළු, බුදුසමයේ ජාත්‍යන්තර ප්‍රවණතා හා බෞද්ධ සාහිත්‍ය විචාරය යන විෂය ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනයක් කිරීම අපේක්ෂිත ය. ඒ ඔස්සේ, ප්‍රමුඛතම ථේරවාද බෞද්ධ මූලාශ්‍රය හා එයින් ප්‍රකට වන විවිධ ප්‍රවණතා පිළිබඳ ප්‍රමාණවත් අවදිකමක් විද්‍යාර්ථීන් තුළ ඇති කිරීම මෙහි අභිමතාර්ථයයි.

## ඉගෙනුම් ඵල :

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීම මගින් විද්‍යාර්ථීහු බුදුසමය පිළිබඳ දැනුමක් මෙන්ම බෞද්ධ මනෝවිද්‍යාව හා මනෝ උපදේශනය, බුදුසමය හා සමාජ ගැටලු, බුදුසමයේ ජාත්‍යන්තර ප්‍රවණතා මෙන්ම බෞද්ධ සාහිත්‍ය විචාරය පිළිබඳව ද ප්‍රාමාණික දැනුමක් ලබා ගැනීමට හැකියාව ලබා ගනිති.

## ක්‍රමවේදය :

දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ, සම්මන්ත්‍රණ පත්‍රිකා හා පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීමට අපේක්ෂිත ය.

**විභාග පටිපාටිය :**

## 1. ලිඛිත පරීක්ෂණය

1.1 ප්‍රථම අධ්‍යයන වර්ෂය අවසානයේ දී පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයේ දී එක් එක් විෂය ඒකකයට අදාළ පැය 03 බැගින් වූ ප්‍රශ්න පත්‍ර හයකට (06) පිළිතුරු සැපයිය යුතුය.

1.2 දේශන පැවැත්වෙන කාල සීමාව තුළ දී විද්‍යාර්ථීන් සෑම විෂය ඒකකයක් සඳහා ම අවම වශයෙන් එක් පැවැරුම බැගින් සම්පාදනය කළ යුතු ය.

1.3 විදේශයන්හි සිට මාර්ගගත ආකාරයෙන් විභාගය සඳහා පෙනී සිටින සිසුන් සඳහා 2024. 02. 22 දින පැවැති සනාතන සභාවේ තීරණය මත Proctering Software System භාවිතා කිරීමට සිදු වේ. ඒ සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකටම දළ වශයෙන් රුපියල් 10.000 ක මුදලක් පාඨමාලා ගාස්තුවට අමතරව විභාග ගාස්තු වශයෙන් ගෙවීමට ශිෂ්‍යයාට සිදු වේ.

## 2. විභාග අක්‍රමිකතා

2.1 අනවසර ලේඛන තමා සන්තකයේ තබා ගැනීම

2.2 අවසරයකින් තොරව ජංගම දුරකථන හෝ වෙනත් දත්ත ගබඩා කළ හැකි උපකරණ තමා සන්තකයේ තබා ගැනීම

2.3 විභාග ශාලාව තුළ දී භාවිතයට ලබා දෙන කඩදාසි ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට රැගෙන යාම.

2.4 ඕනෑම ආකාරයකින් කොපි කිරීම හෝ කොපි කිරීමට උත්සාහ කිරීම.

2.5 අදාළ දිනයට අයත් නොවන හෝ ඉවත් කරන ලද විභාග ලිපි ලේඛණ තම සන්තකයේ තබා ගැනීම හෝ ඒවා භාවිතා කිරීමට උත්සාහ කිරීම.

2.6 තම ශරීරයේ හෝ ඇඳුම්වල සටහන් තබා ගැනීම.

2.7 සඳහන් කිරීමකින් තොරව අන් අයගේ තොරතුරු අනවසරයෙන් භාවිත කිරීම හෝ අන්තර්ජාලයෙන් ලබාගත් තොරතුරු භාවිත කිරිම.

2.8 නීති විරෝධී ලෙස ප්‍රශ්න පත්‍රයක හෝ පිළිතුරු පත්‍රයක අන්තර්ගතය සොයා ගැනීමට හෝ එසේ කිරීමට උත්සාහ කිරීම

2.9 අවසරයකින් තොරව විභාග ශාලාවට ඇතුළු වීම.

2.10 අවසරයකින් තොරව විභාග ශාලාවෙන් පිටවීම හෝ එසේ කිරීමට උත්සාහ කිරීම හෝ එවැනි ක්‍රියාවන්ට සහය දැක්වීම.

2.11 පිළිතුරු සැපයීමට ලබාදෙන කඩදාසි/පිළිතුරු පොතක් ඉරා දැමීමට උත්සාහ කිරීම හෝ ඒ සදහා සහය දැක්වීම.

2.12 විභාග ශාලාවේ සාමකාමී පරිසරයට බාධාකිරිම.

2.13 විභාග අධීක්ෂක / පරීක්ෂක / ශාලා සේවක සේවිකාවන්ගේ ආත්ම ගෞරවයට හානි වන අයුරින් හැසිරීම හා ඔවුන්ට මානසික ආතතිය ඇති කෙරෙන ලෙස හැසිරීම.

2.14 පරීක්ෂකවරුන්/අධීක්ෂකවරුන්/ශාලා සේවක සේවිකාවන්හට කායිකව හෝ මානසිකව හානි කිරීමට සැලසුම් කිරීම හෝ ඒ සඳහා උත්සාහ දැරීම.

2.15 අදාළ විභාග අපේක්ෂකයා වෙනුවට වෙනත් අයකු විභාගයට පෙනී සිටීමට උත්සාහ කිරීම හෝ විභාගයේදී වෙනත් අපේක්ෂකයකුගේ විභාග අංකය භාවිත කිරීමට උත්සාහ දැරීම.

2.16 පුද්ගලාරෝපණය (Impersonation)

2.17 සෙනෙට් සභාව විසින් තීරණය කරනු ලබන අනෙකුත් විභාග අක්‍රමිකතා

2.18 විභාග පරීකෂ්ක විසින් සොයා ගන්නා ලද අක්‍රමිකතා.

2.19 විභාග අක්‍රමිකතා සඳහා ආධාර හෝ අනුබල ලබාදීම.

**3. විභාග අක්‍රමිකතා සඳහා දඬුවම්**

3.1 උත්තර පත්‍ර අවලංගු කිරීම සහ නැවත විභාගයේ ලකුණු සාමාන්‍ය සාමාර්ථයකට සීමා කිරීම.

3.2 අවසාන ප්‍රතිඵල නිකුත් කිරීම එක් අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම

3.3 උපාධි ප්‍රදානෝත්සවය සඳහා ආරාධනා නොකිරීම.

3.4 අදාළ පාඨමාලා ඒකකයේ ප්‍රතිඵල අවලංගු කිරීම සහ නැවත පෙනී සිටින විභාගයේදී ලබා ගත හැකි උපරිම ලකුණු සාමාන්‍ය සාමාර්ථයකට පමණක් සීමා කිරීම.

3.5 පන්ති සාමර්ථ හෝ උසස් සාමාර්ථ ලබා නොදීම.

3.6 වසරකින් ශිෂ්‍යභාවය අත්හිටුවීම.

3.7 වසර දෙකකින් හෝ වසර තුනකින් ශිෂ්‍යභාවය අත්හිටුවීම.

3.8 වසර හතරකින් හෝ වසර පහකින් ශිෂ්‍යභාවය අත්හිටුවීම.

3.9 ශිෂ්‍යභාවය අත්හිටුවීම.

3.10 ශිෂ්‍ය නොවන අයෙකු සම්බන්ධයෙන් රටේ නීතියට අනුව ක්‍රියාමාර්ග ගනු ලැබේ.

3.11 විශ්වවිද්‍යාල අධ්‍යයන / අනධ්‍යයන (තාවකාලික/ස්ථිර) කාර්ය මණ්ඩලයට බඳවා නොගැනීම.

**4. පර්යේෂණ නිබන්ධිකාව**

4.1 නිබන්ධකරණය සඳහා සති 36 ක කාලයක් හිමි වන අතර දෙවන අධ්‍යයන වර්ෂය අවසානයෙහි නිබන්ධිකාව බාර දිය යුතු ය.

4.2 නිබන්ධිකාව බාරදීමේ අවස්ථාව ලිඛිත පරීක්ෂණයෙන් සාමාර්ථයක් ලබන විද්‍යාර්ථීන්ට පමණක් හිමි වන බව සැලකිය යුතුය.

4.3 ඌන සාමාර්ථය ලැබූ විද්‍යාර්ථීන්ට එම ඌන සාමාර්ථ්‍යය ලත් විෂයය හෝ විෂයයන් සම්පූර්ණ කිරීමට යටත් ව සිය නිබන්ධ පර්යේෂණ කාර්යය කරගෙන යාම සඳහා අවස්ථාව සැලසෙනු ඇත.

4.4 අවසාන ප්‍රතිඵල නිකුත් කෙරෙනුයේ ඌන සාමාර්ථ්‍යය ලැබූ විෂයය හෝ විෂයයන් සමත්වීමෙන් පසුවය.

**5. වාචික පරීක්ෂණය**

ලිඛිත පරීක්ෂණයෙන් හා පර්යේෂණ නිබන්ධිකාවෙන් සාමාර්ථය ලබන විද්‍යාර්ථීන් නිබන්ධය ඇසුරින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකට සහභාගී විය යුතු ය.

6. **උපරිම කාල සීමාව**

ඉහත සඳහන් 1, 4 හා 5 යන අවශ්‍යතා සපුරාලීම සඳහා අපේක්ෂකයෙකුට පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ වර්ෂය ද ඇතුලත් ව වර්ෂ හතරක (04) කාලයක් හිමි වේ. වසර හතරක්

අවසානයේදී ද උපාධිය සම්පූර්ණ කිරීමට අපොහොසත් අපේක්ෂකයින්ගේ ලියාපදිංචිය අවලංගු වන බව සැලකිය යුතුය.

## 7. ඇගයීම් ක්‍රමය

7.1 ප්‍රථම වර්ෂාවසානයෙහි පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයේ දී විද්‍යාර්ථියා විසින් එක් එක් විෂය ඒකක සඳහා පැය 03 ප්‍රශ්න පත්‍ර පහකට පිළිතුරු සැපයිය යුතු ය.

7.2 ලිඛිත පරීක්ෂණයට ලකුණු අසූවක් ද (80) පැවරුම සඳහා ලකුණු විස්සක් ද (20) බැගින් එක් විෂය ඒකකයක් සඳහා අපේක්ෂකයින් විසින් උපයා ගත යුතු සමස්ත ලකුණු ප්‍රමාණය සියයකි (100) කි.

7.3 දෑවුරුදු උපාධි පාඨමාලාවේ අපේක්ෂකයින් විසින් ස්වකීය පර්යේෂණ නිබන්ධයට අදාළ ව පර්යේෂණ යෝජනාවලිය සහ සාහිත්‍ය විමර්ශනය යන මැයෙන් ප්‍රස්තුතිකරණයන් ඉදිරිපත් කළ යුතුය.

## 8. ඇගයීම් නිර්ණායක

8.1 සාමාන්‍ය සාමර්ථය :

ප්‍රථම වර්ෂාවසානයෙහි පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයේ දී නියමිත විෂය ඒකක සඳහා අවම වශයෙන් (B-) සාමර්ථ්‍යය හෝ ඉහළ ශ්‍රේණි ලබා අධ්‍යයන සම්භාර 30 උපයා ගැනීම සහ දෙවැනි අධ්‍යයන වසරේ දී පර්යේෂණ නිබන්ධිකාව සම්පූර්ණ කොට අධ්‍යයන සම්භාර 30 උපයා ගැනීමෙන් අධ්‍යයන සම්භාර 60 සම්පූර්ණ කරන GPA අගය 2.70 හෝ ඊට වඩා ලබා ගැනීම යන අවශ්‍යතා සිවු වසරක් ඇතුළත සපුරන විද්‍යාර්ථීන්ට සාමාන්‍ය සාමර්ථ්‍යය හිමි වේ.

## 8.2 කුසලතා සාමර්ථය

ප්‍රථම වර්ෂාවසානයෙහි පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයේ දී නියමිත විෂය එක් ක සඳහා අවම වශයෙන් (B-) සාමර්ථ්‍යය හෝ ඉහළ ශ්‍රේණි ලබා අධ්‍යයන සම්භාර 30 උපයා ගැනීමෙන් GPA අගය 3.70 හෝ ඊට වඩා ලබා ගැනීම, දෙවැනි අධ්‍යයන වසරේ දී පර්යේෂණ නිබන්ධිකාව සම්පූර්ණ කොට A හෝ ඉහළ ශ්‍රේණි උපයා ගැනීමෙන් අධ්‍යයන සම්භාර 60 දෙවසරක් ඇතුළත සපුරන විද්‍යාර්ථීන්ට කුසලතා සාමර්ථ්‍යය හිමි වේ.

## 6.3 ඌන සාමාර්ථය

ප්‍රථම වර්ෂාවසානයෙහි පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයේ දී නියමිත විෂය එක් ක සඳහා අවම වශයෙන් (B-) සාමර්ථ්‍යය හෝ ඉහළ ශ්‍රේණි ලබා ගැනීමට අපොහොසත් වන විද්‍යාර්ථීන් ඊළග අධ්‍යයන වර්ෂයේ දී නැවත විභාගයට පෙනී සිට අවශ්‍ය අධ්‍යයන සම්භාර සම්පූර්ණ කළ යුතුය. නැවත විභාගයට පෙනී සිටින විද්‍යාර්ථීන්ට ලැබෙන ඉහළ ම සාමර්ථ්‍යය වන්නේ (B-) ය. කිසියම් විද්‍යාර්ථියෙකු නැවත විභාගයට පෙනී සිටීමෙන් ලබාගෙන ඇත්තේ ඔහු විසින් පළමු අවස්ථාවේ ලබාගත් ශ්‍රේණියට වඩා පහළ ශ්‍රේණියක් නම් ඔහුට පළමු අවස්ථාවේ ලබාගත් ශ්‍රේණිය නැවත හිමි වේ.

**ශ්‍රේණි ලකුණු :**

| ලකුණු පරාසය | ශ්‍රේණිය | **GPA** |
|---|---|---|
| 85 - 100 | A+ | 4.00 |
| 70 - 84 | A | 4.00 |
| 65 - 69 | A- | 3.70 |
| 60 - 64 | B+ | 3.30 |
| 55 - 59 | B | 3.00 |
| 50 - 54 | B- | 2.70 |
| 45 - 49 | C+ | 2.30 |
| 40 - 44 | C | 2.00 |
| 35 - 39 | C- | 1.70 |
| 30 - 34 | D+ | 1.30 |
| 25 - 29 | D | 1.00 |
| 00 - 24 | E | 0.00 |

**විශේෂ සටහන :**

දෑවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වී ඇති කිසියම් විද්‍යාර්ථියෙක් අදාළ පාඨමාලාවේ ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව ඉදින් එක් අවරුදු ශාස්ත්‍රපති උපාධිය අපේක්ෂා කරන්නේ නම් එම විද්‍යාර්ථියාට එක් අවරුදු ශාස්ත්‍රපති උපාධිය ලබා ගත හැකිය. එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් පාඨමාලාව ආරම්භයේ දී ම ඒ සඳහා ලියාපදිංචි විය යුතු වේ. නමුත් යම් අපේක්ෂයකු හට අධ්‍යයන කාර්ය අතරතුර දී දෑ අවුරුදු පාඨමාලාව හැදෑරීමට හෝ භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අවශ්‍යතාවක් මතු වන්නේ නම් ලියාපදිංචි වන වර්ෂයේ මුල් මාස තුනට (03) පෙර ඒ බව ලිඛිත ව දැනුම් දිය යුතු වේ. එසේ ම දෑ අවරුදු පාඨමාලාවට අදාළ මුදල් ද පියවා කාර්යාලයීය අවශ්‍යතාවන් සම්පූර්ණ කළ යුතුය.

අනතුරුව දෑ අවුරුදු පාඨමාලාවට අදාළ නිබන්ධ අවශ්‍යතාව සම්පූර්ණ කිරීමෙන් එම අපේක්ෂකයින් හට දෑ අවුරුදු පශ්චාද් උපාධිය ලබා ගත හැකිය.

එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව හදාරන අපේක්ෂයින් විසින් උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා ඉහත පාඨමාලා ව්‍යුහය යටතේ අංක 01 සිට 06 දක්වා වූ විෂය ඒකකයන් අනිවාර්යයෙන් හැදෑරිය යුතු වන අතර ඒවායින් අදාළ සාමාර්ථ්‍යය ද ලැබිය යුතු වේ. පළමු වර්ෂයේ දී අදාළ සුදුසුකම් සම්පූර්ණ කිරීමට අපොහොසත් වන එක් අවුරුදු පාඨමාලාව හදාරන අපේක්ෂකයින් හට ද උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා ලැබෙන උපරිම කාලය වසර පහකි.

**පාඨමාලා ව්‍යුහයේ** අංක 07 යටතේ දක්වා ඇති පර්යේෂණ නිබන්ධිකාව සම්පූර්ණ කිරීම දෑවුරුදු උපාධි අපේක්ෂකයින්ට පමණක් අදාළ වන බව සැලකිය යුතුය.

| |
|---|
| ආචාර්ය මණ්ඩලය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය. මකුරුප්පේ ධම්මානන්ද හිමි - අංශ ප්‍රධාන |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය. නාඔටුන්නේ විමලඤාණ හිමි |
| මහාචාර්ය පූජ්‍ය. ගෝණදෙණියේ පඤ්ඤාරතන හිමි |
| මහාචාර්ය පූජ්‍ය. පනහඩුවේ යසස්සි හිමි |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය. දෙනියායේ පඤ්ඤාලෝක හිමි |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය. වැලිමඩගම කුසලධම්ම හිමි |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය. මුවපැටිගේවෙල පඤ්ඤාලෝක හිමි |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය. සූරියවැව විජයවිමල හිමි |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය. වලස්මුල්ලේ භද්දිය හිමි |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත ගරුසිංහ මහතා |
| විශ්‍රාමික මහාචාර්ය ආනන්ද විජේරත්න මහතා |
| සහාය මහාචාර්ය සරත් චන්ද්‍රසේකර මහතා |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අමිල කළුආරච්චි මහතා |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රවිඳු ප්‍රියංක මහතා |
| ආචාර්ය සී.සී. ජයසුන්දර මහතා |
| ආචාර්ය ආර්. ඒ. ඒ. එස්. රණවීර මිය |
| ආචාර්ය අශෝක ප්‍රියදර්ශන මහතා |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජී.පී.කේ. පෙරේරා මහතා |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හසන්ත සමරසිංහ මහතා |
| කථිකාචාර්ය ශ්‍රියානි හේමලතා මිය |
| කථිකාචාර්ය රක්ෂණ සුපුන් කළුආරච්චි මහතා |
| කථිකාචාර්ය ගිහාන් මල්ලවආරච්චි මහතා |

## පාඨමාලා ඒකක

**සංකේතාංකය : MABS 53015**

**මාතෘකාව :** පාලි ත්‍රිපිටක ධර්ම අධ්‍යයනය

**අරමුණු හා අභිමතාර්ථ :**

පාලි ත්‍රිපිටකය, ඉන් ප්‍රකට වන දර්ශනය හා ආචාරමාර්ගය පිළිබඳ ප්‍රමාණවත් මූලික දැකීමක් ඇති කරලීමත්, ඓතිහාසික ව, විචාරාත්මක ව හා විස්තරාත්මක ව පාලි ත්‍රිපිටකාගත ධර්ම විනය පිළිබඳ අවදිකමක් ඇති කර ගැනීමට මග සැලසීමත් මෙම පාඨමාලා ඒකකය තුළින් අපේක්ෂිතය.

**ඉගෙනුම් ඵල :**

මෙම විෂය ඒකකය සම්පූර්ණ කිරීම මගින් විද්‍යාර්ථීහු පාලි ත්‍රිපිටකය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමින් විශේෂයෙන් ම **මුල් බුදුසමය** හා ඉන් විවරණය වන දාර්ශනික සංකල්ප, **විනය** පිටකයෙන් අනාවරණය කෙරෙන ශික්ෂණ මාර්ගය, **ආභිධර්මික** විශ්ලේෂණ ක්‍රම, සාම්ප්‍රදායික අර්ථ විවරණ ආදිය පිළිබඳ විචාරපූර්වක දැනුම ප්‍රකට කිරීමට හැකියාව ලබති.

**පාඨමාලා අන්තර්ගතය :**

ආදි බුදුසමයට පසුබිම් වූ භාරතීය දෘෂ්ටිවාද, ආදි සූත්‍රාන්තයන්හි පැනෙන අද්වයවාදී ප්‍රවණතා, මධ්‍යම දේශනාව, මධ්‍යම ප්‍රතිපදාව, ආත්ම අනාත්ම දෘෂ්ටි විචාරය., ඛන්ධායතන ධාතු විභාගය, ඉන් ප්‍රකටවන සංශ්ලේෂණාත්මක අධ්‍යයනය හා ත්‍රිලක්ෂණය., පටිච්චසමුප්පාදය - එහි සුවිශේෂතා, මූලික අරමුණු, අතිරේක අරමුණු,

චතුරාර්ය සත්‍යය., කර්මය, සූත්‍රාන්තයන්හි ඒ පිළිබඳව එන විවරණ, සමකාලීන ඉගැනවීම් අතර එහි සුවිශේෂත්වය හා ප්‍රායෝගිකත්වය., ගෘහ ජීවිතය, එහි ප්‍රගතිය හා පරාභවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් වත්මන් සමාජයට ද අදාළ වන ආකාරය., බෞද්ධ පැවිද්ද හා උපසම්පදාව - විනය ශික්ෂාවල අරමුණු, ධර්මය හා විනය අතර ඇති සම්බන්ධය, විනය නීති පැනවීමේ ශාසනික පසුබිම., භික්ෂු භික්ෂුණීන්ට අදාළ මූලික විනය ප්‍රඥප්ති, ශෛලීගත ස්වරූපය, අධිකරණ සමථ, සංඝ කර්මාදියෙන් ප්‍රකටවන පාලන සංවිධානය., අභිධර්මයේ ප්‍රභවය, ස්වභාවය, අරමුණු, අභිධර්මයට පාදක වී ඇති පාලි සූත්‍ර දේශනා., ථෙරවාද අභිධර්මාගත ධර්ම විශ්ලේෂණය හා සංශ්ලේෂණය, එමඟින් ප්‍රකටවන බුදුදහමෙහි සංවර්ධනය, ආදි බුදුදහමෙහි මූලධර්ම අභිධර්මය තුළ විවරණය වී ඇති ආකාරය.

**ඉගැන්වීම් ක්‍රමවේදය :**

දේශන, සාකච්ඡා සහ අභ්‍යාස

**ඇගයීම් ක්‍රමය :**

පැවරුම්, ඉදිරිපත් කිරීම් හා ක්ෂේත්‍ර අධ්‍යයන සඳහා 20% ක් හා වර්ෂාවසාන පරීක්ෂණය සඳහා 80% ක් බැගින් ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

**නිර්දේශිත කියවීම් :**


1. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාවෙහි අදාළ තැන්.
2. රාහුල හිමි, වල්පොළ., 2001., බුදුන් වදාළ ධර්මය., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය., නැදිමාල.
3. අබේනායක, ඔලිවර්., 2009., බෞද්ධ අධ්‍යයන විමර්ශන., විමල විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය., පුංචි බොරැල්ල., මරදාන.
4. ජයතිලක, කේ. එන්., (පරි හේ මු තිලකරත්න), 2003., මුල් බුදුසමය හා ඥාන විභාගය., ගොඩගේ., මරදාන.
5. මේධානන්ද හිමි., දේවාලේගම, 2006, මුල් බුදුසමය - සාමයික පසුබිම., සරස්වතී., දිවුලපිටිය.
6. කලුපහන, ඩී. ජේ., 2003., බෞද්ධ දර්ශන ඉතිහාසය., ප්‍රියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්., නුගේගොඩ.
7. ගල්මංගොඩ සුමනපාල., 2007., ආදි බෞද්ධ දර්ශනය., සරස්වතී ප්‍රකාශන., දිවුලපිටිය.
8. තිලකරත්න, අසංග., 1995., අභිධර්ම අධ්‍යයනය., කොළඹ., කරුණාරත්න සහ පුත්‍රයෝ., කොළඹ.
9. ඤාණසීහ හිමි, හේන්පිටගෙදර., 1960., අභිධර්ම පරීක්ෂණය., බෞද්ධ සංගමය, ඇකිරියගල.
10. අබේනායක, ඔලිවර්., 2011., බෞද්ධ අධ්‍යයන විමර්ශන., සමාධි, පුවක්පිටිය.
11. ධර්මවංශ හිමි, මාතර., 1982., අභිධර්ම චන්ද්‍රිකාව., කොළඹ තරුණ බෞද්ධ සංගමය., බොරැල්ල.
12. Conze" Edward., 1951., ***Buddhism, Its Essence and Development***. London.
13. Kalupahana, D.J., 1976., ***Buddhist Philosophy**: **A Historical Analysis.,*** U.S.A.

14. Karunaratna,W.S., 1988., ***The Theory of Causality***., Godage., Colombo.
15. Tilakarathne. Asanga., 1993., ***Nirvana and Ineffability***, Godage" Colombo.
16. ***The Universe; Concomitants of consciousness in the Abhidhamma Psychology***, (Bukkyo Kenkyn), Vol. ix, Japan.
17. Wettamuny, R.G. de. S., 1969., ***The Buddha's Teaching*.,** Godage., Colombo.

**සංකේතාංකය : MABS 53025**

**මාතෘකාව : බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය අරමුණු**

**හා අභිමතාර්ථ :**

බටහිර මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් සහ මනස පිළිබඳව සූත්‍රාන්ත දේශනාවල එන කරුණු මෙන්ම අභිධර්මය ඔස්සේ කෙරෙන මනෝවිශ්ලේෂණය පිළිබඳ විශේෂ අවබෝධයක් ලබාදීමත් අනුසාසනා අර්ථයෙන් සිදුවන බෞද්ධ මනෝ උපදේශනය විවරණය කරමින් බෞද්ධ මනෝ උපදේශනයේ සුවිශේෂත්වය හා වැදගත්කම පිළිබඳ තුලනාත්මක අවබෝධයක් ලබා දීමත් මෙම විෂය ඒකකය මගින් අපේක්ෂිතය.

**ඉගෙනුම් ඵල :**

මෙම විෂය ඒකකය සම්පූර්ණ කිරීම මගින් විද්‍යාර්ථීහු බටහිර හා බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ තුලනාත්මක අවබෝධයක් ලබා ගනිමින් අනුක්‍රමයෙන් වැඩිවෙමින් පවතින විවිධ මානසික ගැටලු විසඳා ගැනීමට මෙම ඉගැන්වීම් ප්‍රායෝගිකව උපයෝගී කර ගැනීමට සමත් වෙති.

**පාඨමාලා අන්තර්ගතය :**

***මනෝවිද්‍යාව හැඳින්වීම ;*** නිර්වචන, ඉතිහාසය, විවිධ ගුරුකුල, චිකිත්සක ක්‍රම, ඇමෙරිකානු මනෝවිද්‍යා සංගමයට අනුව එහි ඇති ශාඛා, ඒවායේ මුඛ්‍යාර්ථ, මනෝවිද්‍යාවෙහි ඇති ප්‍රධාන සංකල්ප

***බෞද්ධ මනෝවිද්‍යාව හැඳින්වීම ;*** බෞද්ධ මනෝවිද්‍යාවේ පසුබිම, බෞද්ධ මනෝවිද්‍යාව පිළිබඳ නූතන පරීයේෂණ, චිත්ත, මනො,

විඤ්ඤාණ යනාදි පදවල අර්ථ විභාගය, චිත්ත චෛතසික විග්‍රහයෙහි මනෝවිද්‍යාත්මක පදනම, ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය හා ඒ සඳහා බලපාන සාධක., ***ආවේග සහ පුද්ගල චර්යා ;*** අකුසල මූල සහ කුසල මූල, අකුසල කර්ම හා කුසල කර්ම, පින හා කුසලය, කර්මය හා කර්ම විපාකය, පුද්ගල මනෝගතික සාධක., ***මනෝ චිකිත්සක ක්‍රමයක් ලෙස භාවනාව ;*** භාවනා ක්‍රම, කමටහන්, චරිත ලක්ෂණ සහ චරිත වර්ග, භාවනාව දෛනික ජීවිතය හා විමුක්ති මාර්ගය, ***උපදේශනය හැඳින්වීම;*** නිර්වචන හා උදේශනයෙහි ඉතිහාසය, උපදේශන විධික්‍රම, උපදේශන ක්‍රියාවලිය, උපදේශකයෙකු තුළ තිබිය යුතු ගුණාංග, උපදේශනය අවශ්‍ය කරන පුද්ගලයින් හඳුනා ගැනීම., උපදේශන වර්ගීකරණය., **බෞද්ධ උපදේශනය හැඳින්වීම.**, මානසික රෝග හා මානසික රෝග ඇතිවීමට බලපාන හේතු, DSM IV වර්ගීකරණයට අනුව මානසික රෝග විවරණය, පොදු මානසික රෝග., **බෞද්ධ මනෝ චිකිත්සාව;** මනෝරෝග විෂයෙහි බෞද්ධ ප්‍රතිකර්ම., **ආතතිය;** ආතතිය හැඳින්වීම, ආතතිය විෂයෙහි තාක්ෂණය හා සංවර්ධනයෙහි බලපෑම, ආතති කළමනාකරණ හා බෞද්ධ ක්‍රමෝපාය., **තරහව හෙවත් අධික කේන්තිය.**

**ඉගැන්වීම් ක්‍රමවේදය :** දේශන, සාකච්ඡා හා අභ්‍යාස.

**ඇගයීම් ක්‍රමය :** පැවරුම්, ඉදිරිපත් කිරීම් හා ක්ෂේත්‍ර අධ්‍යයන සඳහා 20% ක් ද වර්ෂාවසාන ලිඛිත පරීක්ෂණය සඳහා 80% ක් ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

**නිර්දේශිත කියවීම් :**


1. ගල්මංගොඩ, සුමනපාල., 2008., බෞද්ධ භාවනා ක්‍රම සහ මනෝචිකිත්සාව., සරස්වතී ප්‍රකාශන, දිවුලපිටිය.
2. චන්ද්‍රසේකර, සරත්., 2008., ප්‍රායෝගික බෞද්ධ මනෝවිද්‍යාව., ගොඩගේ, කොළඹ.
3. ඤාණතිලක හිමි, තිස්ස., 1984., මිනිස් ගැටළු පිළිබඳ බෞද්ධ විග්‍රහය., ගොඩගේ, කොළඹ.
4. නිශ්ශංක, එච්.එස්.එස්., 2001., බෞද්ධ මනෝචිකිත්සාව, ගුණසේන, කොළඹ.
5. ඒ.එස් කලුආරච්චි., 2011., බෞද්ධ මනෝවිද්‍යාව., මාගධී ප්‍රකාශකයෝ., අවිස්සාවේල්ල.
6. Bloom, B.L., 1997., ***Planned short - term Psychotherapy: A Clinical Handbook*** (2nd Ed) Boston: Allyn and Bacon.
7. Boorsten. S., Deatherege. G.O., 1982., ***Buddhism in Psychotherapy.***, Buddhist Publication Society., Kandy.
8. Carline A.F., Rhys Davids 1996., ***A Buddhist Manual of Psychological Ethics***., Munsiram Manoharlal Publishers Pvt. Ltd., First Edition.
9. David, J. Kalupahana., 1987., ***The Principles of Buddhist Psychology.***, New York State, University of New York.

**සංකේතාංකය : MABS 53035**

**මාතෘකාව : බුදුසමය හා සමාජ ගැටලු**

**අරමුණු හා අභිමතාර්ථ :**

ආර්ථික, දේශපාලන, සදාචාරමය වශයෙන් හඳුනාගත හැකි ශ්‍රී ලාංකේය හා විශ්ව සමාජය මුහුණ දී ඇති පොදු ගැටලු පිළිබඳ ප්‍රමාණවත් අවදිකමක් ඇති කිරීමත් එම ගැටලු පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් සම්බන්ධයෙන් පුළුල් අවබෝධයක් ලබා දීමත් මෙම පාඨමාලා නිර්දේශය තුළින් අපේක්ෂිතය.

**ඉගෙනුම් ඵල :**

විද්‍යාර්ථීහු මෙම විෂය ඒකකය හැදෑරීමෙන් ආර්ථික, දේශපාලන, සදාචාරමය ආදී වශයෙන් සමාජය තුළ පැනනගින විවිධ ගැටලුවල හේතු විනිවිද දකමි න් ඒවා විසඳා ගැනීමට බෞද්ධ ඉගැන්වීම අදාළ කරගැනීමට සමත් වෙති.

**පාඨමාලා අන්තර්ගතය :**

**දරිද්‍රතාව ආශ්‍රිත සමාජ ගැටලු ;** දරිද්‍රතාව හා ඉන් ප්‍රභවය වන විවිධ සමාජ ගැටලු හඳුනා ගැනීම, එහිලා පාදක වී ඇති හේතු සාධක හා ඒ පිළිබඳ නූතන සමාජ විද්‍යාත්මක අවධානය, දරිද්‍රතාව හා ඉන් උපදින සමාජ ගැටලු පිළිබඳ බෞද්ධ දැක්ම, **තරඟකාරීත්වය හා ආර්ථික සමෘද්ධියට අදාළ නූතන ක්‍රමෝපාය තුළින් පැන නඟින සමාජ ගැටලු;** විවෘත වෙළඳපොළ, අධි තරඟකාරිත්වය, අවශ්‍යතාවන්ගේ අසීමිත බව, පරිභෝජනවාදී ආර්ථිකය හා කායික මානසික සෞඛ්‍යය පිළිබඳ

ගැටලු, **අපරාධ වර්ධනය ;** අපරාධ පිළිබඳ නූතන විග්‍රහය, අපරාධවල විවිධ ස්වරූප, අපරාධ කෙරෙහි බලපාන විවිධ හේතු සාධක, නීතිය හා දඬුවම ආදී කරුණු, අපරාධ වර්ධනය හා අපරාධ මර්දනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්., **සදාචාරමය ගැටලු;** මානව සදාචාරය පිළිබඳ නූතන අධ්‍යයන, සමාජයේ යහපැවැත්ම පිණිස සදාචාරයෙහි අවශ්‍යතාව, විවිධ සදාචාර විරෝධී ක්‍රියාකාරකම්, ඒවා වළක්වා ගැනීමට බුදුසමයෙන් ලැබෙන මඟ පෙන්වීම., **පවුල් ජීවිතය හා විවාහ ගැටලු;** නූතන සමාජය තුළ විද්‍යාමාන වන පවුල් ජීවිතය හා විවාහ සංස්ථාව ආශ්‍රිත ගැටලු හඳුනාගැනීම, ඒවා විසඳා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් අදාළ කර ගත හැකි ආකාරය., **තරුණ පරපුරේ ගැටලු ;** තාරුණ්‍යය ආශ්‍රිත නූතන සමාජ ගැටලු හා අධ්‍යයන, තරුණ අසහනය, ඒවා විසඳා ගැනීමට බුදුසමයෙන් ලබා ගත හැකි පිටිවහල., **පරිසර දූෂණය;** මිනිසා සහ පරිසරය, මිනිසාට පරිසරයත් පරිසරයට මිනිසාත් බලපාන අයුරු: පරිසරය පිළිබඳ බෞද්ධ ආකල්පය, පරිසර ගැටළු සහ පරිසර සංරක්ෂණයට බුදුසමයෙන් ලැබෙන අනුබලය., **ජනගහන වර්ධනය; පෞද්ගලික මානසික ගැටලු;** මානසික අසහනය, පසුතැවීම, නො සන්සුන්කම, ආතතිය, චිත්තවේග පාලනය කර නො ගැනීම, **නූතන දැනුම ආශ්‍රිත සමාජ ගැටලු;** ගෝලීකරණය, නවීකරණය, වාණිජකරණය, කාර්මිකරණය, විද්‍යාව හා තාක්ෂණය ඇසුරුකොට ගෙන පැන නැගී ඇති සමාජ ගැටලු.,

**ඉගැන්වීම් ක්‍රමවේදය :** දේශන, සාකච්ඡා හා අභ්‍යාස

**ඇගයීම් ක්‍රමය :** පැවරුම්ල ඉදිරිපත් කිරීම් හා ක්ෂේත්‍ර අධ්‍යයන සඳහා 20% ක් ද වර්ෂාවසාන ලිඛිත පරීක්ෂණය සඳහා 80% ක් ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

**නිර්දේශිත කියවීම් :**


1. ඤාණතිලක හිමි., තිස්ස., 1988, මිනිස් ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය., ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ, බොරැලස්ගමුව.
2. සෝමරංසි හිමි, උඩගල්දෙණියේ., 1970., බෞද්ධ දර්ශනය හා සමාජ දර්ශනය., ජී.ජී. අබේකෝන් බණ්ඩාර., තලාව.
3. කරුණාරත්න, ඩබ්ලිව්.එස්., 1987., බෞද්ධ දර්ශනය හා චරණය., ගොඩගේ, කොළඹ.
4. රත්නපාල, නන්දසේන., 1999., බුදුදහම, සමාජ විද්‍යාව හා ජනජීවිතය., ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ.
5. මේධානන්ද හිමි, දේවාලේගම., 2004., භික්ෂු සමාජය., දයාවංශ ජයකොඩි සමාගම., මරදාන.
6. Weeraratna, W.G., 1977., ***Individual and Society in Buddhism**.,*Gunasena, Colombo.
7. Jayatilleke, K.N., 1975., ***The Message of the Buddha.**,* Buddhist Society Kandy.
8. Silva, de, padmasiri., 1976., ***Tangles and Webs.***, Godage, Colombo.

**සංකේතාංකය : MABS 53045**

**මාතෘකාව : බුදුසමයෙහි ජාත්‍යන්තර ප්‍රවණතා**

**අරමුණු හා අභිමතාර්ථ :** බුදුදහම ලෝකයේ ප්‍රබල ආගමක් හා විශිෂ්ට දර්ශනයක් වශයෙන් ආසියාතික හා යුරෝපා රටවල විවිධ අභියෝග සමතික්‍රමණය කරමින් ව්‍යාප්ත වූ ආකාරය හා එකී ව්‍යාප්තියට බලපෑ හේතු සාධක විශ්ලේෂණය කිරීම, මානව වර්ගයාගේ ඥානය හා බුද්ධිය විකසිත කිරීම වෙනුවෙන් ඉන් සිදුවූ මෙහෙවර පිළිබඳ දැනුමක් ලබා දීම හා වර්තමානය වන විට යුරෝපා රටවල බුදුදහම ව්‍යාප්ත වන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙයින් අපේක්ෂිතය.

**ඉගෙනුම් ඵල :**

විද්‍යාර්ථීහු මෙම විෂය ඒකකය හැදෑරීමෙන් බුදුදහම ඉන්දියාව, ශ්‍රී ලංකාව, චීනය, ජපානය, කොරියාව, තායිලන්තය වැනි රටවල මෙන්ම ඇමරිකාව බ්‍රිතාන්‍යය වැනි රටවල ද ව්‍යාප්තව ගිය ආකාරය, විවිධ නිකාය හා ගුරු කුල ඔස්සේ බෞද්ධ දාර්ශනික චින්තනය සංවර්ධනය වූ ආකාරය හා මානව වර්ගයාගේ හිතසුව පිණිස බුදුසමය සපයන සක්‍රීය දායකත්වය පිළිබඳ දැනුම ප්‍රකට කිරීමට සමත් වෙති.

**පාඨමාලා අන්තර්ගතය :**

***භාරතීය බුදුසමය ;*** ආරම්භක යුගයේ බුදුසමයෙහි භෞගෝලීය ව්‍යාප්තිය, ධර්ම - විනය සංග්‍රහ කිරීම, එහි විකාශය, අශෝක යුගය, බුදුසමයේ පුනර්ජීවය හා අනගාරික ධර්මපාලතුමාගේ කාර්යභාරය, දක්ෂිණ භාරතීය බුදුසමය සහ අම්බෙට්කාර් තුමා., ***තායිලන්තයේ (සියම) බුදුසමය ;*** තායිලන්තයට බුදුසමය හඳුන්වාදීම හා ව්‍යාප්තිය,

තායිලන්ත භික්ෂු පරිපාලන ව්‍යුහය හා අනන්‍යතාව, ***ස්වර්ණභූමි හෙවත් බුරුමයේ (මියැන්මාර්) බුදුසමය ;*** බුරුමයට බුදුසමය හඳුන්වාදීම, ප්‍රාග් බෞද්ධ ඉගැන්වීම් බුදුසමයට අවශෝෂණය වීම, බෞද්ධ රාජධානි, බුරුමයේ පැවැත්වූ සංගායනා සහ ජාත්‍යන්තර සබඳතා, බුරුම ජනජීවිතය හා බුදුසමය., ***චීනයේ බුදුසමය ;*** බුදුසමය හඳුන්වාදීම, චීන බුදුසමයෙහි අනන්‍යතාව, චීන බෞද්ධ ඉතිහාසයේ සුවිශේෂ යුග, සාහිත්‍යය සහ සංස්කෘතිය, ***ටිබෙට් බුදුසමය සහ ලාමාවාදය ;*** ටිබෙට් බුදුසමයේ උදාව, දලයි ලාමා තුමා සහ බෞද්ධ රාජ්‍ය සංකල්පය, ටිබෙට් සංස්කෘතිය, ථෙරවාද සහ මහායාන බෞද්ධ ඉගැන්වීම්, ජාත්‍යන්තර ව්‍යාප්තිය., ***ජපන් බුදුසමය ;*** බුදුසමයෙහි සම්ප්‍රාප්තිය සහ එහි ව්‍යාප්තිය, සමාජීය නවීකරණයන්, ***කොරියානු බුදුසමය ;*** ප්‍රාග් බෞද්ධ ආගමික විශ්වාස, බුදුසමය හඳුන්වාදීම, බෞද්ධ යුග, බෞද්ධ ගුරුකුල, කොරියානු බුදුසමයෙහි ප්‍රායෝගික භාවිතය., ***යුරෝපයේ සාමයික පසුබිම සහ ඒ කෙරෙහි බෞද්ධ බලපෑම ;*** දහනව වැනි සියවසේ යුරෝපීය ආගමික පසුබිම, යුරෝපීය චින්තකයන්, දාර්ශනිකයන් සහ බුදුදහම, බෞද්ධ සංකල්ප පදනම් කර ගත් පර්යේෂණ, යුරෝපීය බෞද්ධ පුනරුදය හා එහි අනන්‍යතාව., ***ආගම පිළිබඳ එක්සත් රාජධානියේ සහ යුරෝපයේ දර්ශනය ;*** ආගම පිළිබඳ නූතන නිර්වචන, විද්‍යාත්මක දෘෂ්ටිය, චින්තනය සහ ආගම අතර සම-විෂමතා, සමකාලීන විඥානය සහ බෞද්ධ සංකල්ප, බෞද්ධ සාරධර්ම පිළිබඳ යුරෝපීයයන්ගේ ආකල්පය, බෞද්ධ භාවනාව පිළිබඳ යුරෝපීයන්ගේ ආකර්ෂණය, බෞද්ධ දර්ශනය හා නූතන යුරෝපීය සමාජ ගැටලු, නූතන සමාජය හමුවේ භික්ෂුවගේ කාර්යභාරය, ලෝක බෞද්ධ සම්මේලනය,

අනෙකුත් බෞද්ධ සමිති සංවිධාන හා බුදුසමයෙහි ආරක්ෂාව සහ ව්‍යාප්තිය.

**ඉගැන්වීම් ක්‍රමවේදය :** දේශන, සාකච්ඡා හා අභ්‍යාස

**ඇගයීම් ක්‍රමය :** පැවරුම්, ඉදිරිපත් කිරීම් හා ක්ෂේත්‍ර අධ්‍යයන සඳහා 20% ක් ද වර්ෂාවසාන ලිඛිත පරීක්ෂණය සඳහා 80% ක් ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

**නිර්දේශිත කියවීම් :**


1. විමලසිරි හිමි, බෝයගම., 1970., තායිලන්ත බෞද්ධ සංස්කෘතිය., ගුණසේන සහ සමාගම, කොළඹ.
2. ආනන්ද හිමි, වැල්ලවත්තේ සහ කාන්ගහආරච්චි, ටී.බී., 1963., සංක්ෂිප්ත ලෝක බෞද්ධ සංස්කෘතිය., ගුණසේන, කොළඹ.
3. ඬේවිට්ස්, රීස්., 1956., බෞද්ධ භාරතය., මංගල ට්‍රේඩර්ස්, කොළඹ.
4. පූසැං ලුවී ද වෙලා., 1989., බෞද්ධ ධර්ම සංගායනා., ගොඩගේ කොළඹ.
5. බෂාන්, ඒ, එල්, 1962., අසිරිමත් ඉන්දියාව., අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව, කොළඹ.
6. ශාන්ති හිමි, කිරින්දේ, 1962., මධ්‍ය ආසියාවේ බෞද්ධ සංස්කෘතිය., රත්නාවලී ප්‍රකාශකයෝ, කොළඹ.
7. සුමංගල, උඩුගම, විමලබුද්ධි, යටියන, 1996., බෞද්ධ ශිෂ්ටාචාරයේ ව්‍යාප්තිය., ගොඩගේ, කොළඹ.
8. ඉලංගසිංහ මංගල, 1997., ආසියාවේ බෞද්ධ ඉතිහාසය., අභය මුද්‍රණ, කඩවත.
9. Puri, B.N., 1987., ***Buddhism in Central Asia, Motilal Banarsidass.,*** Mothilal Burnarasidass, New Delhi.

10. Bane rjee, A.C., 1973., ***Buddhism in India and Abroad, World**.,* Press., Mothilal Burnarasidass., Calcutta.
11. Bapat, P.V., 1956., ***2500, Years of Buddhism.***, Ministry of Information and Broadcasting., New Delhi.
12. Dutt, Sukumar, 1962., ***Buddhism in East Asia.**,* London.

**සංකේතාංකය : MABS 53055**

**මාතෘකාව : බෞද්ධ සාහිත්‍ය විචාරය**

**අරමුණු හා අභිමතාර්ථ :** බෞද්ධ සාහිත්‍ය විචාරය පිළිබඳ අවබෝධයක් ලබා දීමත් සුවිශේෂත්වය හා වටිනාකම පෙන්වා දෙමින් එකී බෞද්ධ සාහිත්‍ය විචාර නිර්ණායක ඇසුරෙන් සාහිත්‍ය සංගීත කලාවන් විචාරය කිරීමේ ඥානය ලබා දීමත් මෙයින් අපේක්ෂිතය.

**ඉගෙනුම් ඵල :**

මෙම ඒකකය හැදෑරීමෙන් විද්‍යාර්ථීහු සාහිත්‍යමය වශයෙන් වැදගත් වන සූත්‍රාන්ත දේශනා, පාලි සාහිත්‍යය සිංහල හා සංස්කෘත සාහිත්‍යයේ නිර්මාණ හා විචාර ක්ෂේත්‍රයට ලබා දුන් දායකත්වය, භාරතීය සාහිත්‍ය විචාර මූලධර්ම හා බෞද්ධ සාහිත්‍ය විචාර මූලධර්ම, කාව්‍ය නාට්‍ය චිත්‍රපට ආදිය පිළිබඳ බෞද්ධ ආකල්පය ආදි සාහිත්‍යය හා සාහිත්‍ය විචාරය ආශ්‍රිත විවිධ විෂය සන්දර්භයන් පිළිබඳ ඥානය ප්‍රකට කිරීමට සමත් වෙති.

**පාඨමාලා අන්තර්ගතය :**

***සාහිත්‍යය, සාහිත්‍ය විචාර විධික්‍රම හා බෞද්ධ සාහිත්‍ය විචාරය;*** සාහිත්‍යය හා සාහිත්‍ය විචාරය, (පෙරදිග, අපරදිග) සාහිත්‍ය විචාරය හා මාක්ස්වාදය, පශ්චාත් නූතනවාදය වැනි සාහිත්‍ය විචාරවාද, ***බෞද්ධ සාහිත්‍ය විචාරයේ පසුබිම ;*** බෞද්ධ සාහිත්‍ය විචාරයේ ආරම්භය හා විකාසය., උසස් සාහිත්‍යයක් බිහිවීමට අවශ්‍ය කරුණු, බෞද්ධ දාර්ශනික මූලධර්ම සාහිත්‍යකරණයට හා විචාරයට පදනම් වන ආකාරය., ***බෞද්ධ සාහිත්‍ය විචාරයේ අනන්‍යතාව;*** බෞද්ධ සාහිත්‍ය විචාරයේ අනන්‍යතාව, විචාර කලාවේ පෝෂණයට බුදුදහමේ ආභාෂය, නව

විචාරක නිර්ණායක, සංකල්ප රාගය හා සෞන්දර්ය, අනුපාදන ආකල්පය, අස්සාද ආදීනව නිස්සරණ, වින්දනය හා අවබෝධය, පවිවෙක යනාදිය., ***ගද්‍ය පද්‍ය භාෂාව හා සාහිත්‍යය ;*** මජ්ඣිම නිකායේ අරණවිභංග සූත්‍රය පාදක කොට ගෙන භාෂාවේ භාවිතය හා එහි උපයෝගීතාව විමසීම, ***ත්‍රිපිටකයෙහි භාවිත රස සහ අලංකරණ විධි ;*** පෙළෙහි දක්නට ලැබෙන රූපක, ධ්වනි, සංකේත, සංවාද, ප්‍රහේළිකා ආදිය, රසය පිළිබඳ බෞද්ධ ආකල්පය හා සූත්‍රාන්ත දේශනාවල විද්‍යාමාන වන රසෝත්පාදක ප්‍රකාශන, අලංකරණය පිළිබඳ බෞද්ධ ආකල්පය, ***ආඛ්‍යාන සහ ජීවිතාවබෝධය;*** බොසත් චරිතය හා ජීවිත පරිඥානය, බුද්ධචරිතය හා සෞන්දර්ය, ආඛ්‍යානමය සූත්‍රාන්ත, කථා හා භාසිත, ජාතක කථා සහ ජීවිත දර්ශනය, ථෙර ථෙරීගාථා හා නිරාමිෂ වින්දනය, අනුපාදන ආකල්පය., ***කලාත්මක නිර්මාණය පිළිබඳ බෞද්ධ විචාරය ;*** කවිය, ගීතය, නාට්‍යය, චිත්‍රපට හා චිත්‍ර, මූර්ති කැටයම් ආදි කලාත්මක නිර්මාණ පිළිබඳ බෞද්ධ දැක්ම, ***සිංහල සාහිත්‍ය ක්ෂෙත්‍රය විෂයෙහි බෞද්ධ දායකත්වය ;*** පුරාතනයේ සිට නූතනය දක්වා සම්භාව්‍ය සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍ය නිර්මාණයන්හි බෞද්ධ පදනම., ***සංස්කෘත සාහිත්‍ය විචාරයේ මූලධර්ම;*** භාරතීය සාහිත්‍ය විචාරකයින්, කෘති හා මූලධර්ම, රසවාදය, අලංකාරවාදය, රීතිවාදය, ධ්වනිවාදය, වක්‍රෝක්තිවාදය හා ඖචිත්‍යවාදය, ගුණ දෝෂ සංකල්පය යනාදිය., ***පද්‍යකරණය හා අලංකරණය (වුත්තෝදය හා සුබෝධාලංකාරය ඇසුරෙන්) ;*** වුත්තෝදයේ හා සුබෝධාලංකාරයේ පද්‍යකරණය සඳහා වන උපදේශ, බෞද්ධ කාව්‍යවිචාරයෙහි ලා

සංඝරක්ඛිත හිමියන්ගේ දායකත්වය, බෞද්ධ සාහිත්‍යය විෂයෙහි සංස්කෘත කාව්‍ය විචාර වාදයන්හි අදාළත්වය.

**ඉගැන්වීම් ක්‍රමවේදය** : දේශන, සාකච්ඡා හා අභ්‍යාස

**ඇගයීම් ක්‍රමය :** පැවරුම්, ඉදිරිපත් කිරීම් හා ක්ෂේත්‍ර අධ්‍යයන සඳහා 20% ක් ද වර්ෂාවසාන ලිඛිත පරීක්ෂණය සඳහා 80% ක් ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

නිර්දේශිත කියවීම් :


1. Kalupahana, D.J., 1976., ***Buddhist Philosophy**: **A Historical Analysis.,*** U.S.A.
2. Karunaratna,W.S, 1988., ***The Theory of Causality.,*** Godage., Colombo,.
3. Tilakarathne. Asanga., 1993., ***Nirvana and Ineffability**,* Godag., Colombo.
4. Bukkyo, Kenkyn., 1995., ***The Universe; Concomitants of consciousness in the Abhidhamma Psychology**,* Vol. ix, Japan.
5. Wettamuny, R.G. de. S., 1969., ***The Buddha's Teaching.,*** Godage" Colombo.
6. Mrs. Davids, Rhys., (Tr), 1951., ***Psalms of the Early Buddhists** - **Psalms of The Brethren**.,* P T S., London.

7. Mrs. Davids, Rhys., (ed: & Tr) 1948., ***Psalms of the Early Buddhists - Psalms of the Sisters**.,* P T S., London.

**සංකේතාංකය : MABS 53065**

**මාතෘකාව : පර්යේෂණ ක්‍රමවේදය**

**අරමුණු හා අභිමතාර්ථ :**

පාලි හා බෞද්ධ අධ්‍යයනයට අදාළ අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල නියැලෙන ආධුනික විද්‍යාර්ථීන් උදෙසා පර්යේෂණ ක්‍රම විද්‍යාව පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් හා බෞද්ධ අධ්‍යයන පර්යේෂණ පිළිබඳ විශේෂ අවබෝධයක් ද ලබාදීම මෙම විෂය ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**ඉගෙනුම් ඵල :**

මෙම පාඨමාලාව හැදෑරීමෙන් විද්‍යාර්ථියා, පර්යේෂණයක් සැළසුම් කිරීම, ශාස්ත්‍රීය පර්යේෂණයන්ට අදාළ මූලාශ්‍රය විධිමත් ව අධ්‍යයනය කිරීම, විවිධ පර්යේෂණ ක්‍රමයන්ගේ විශේෂතා හඳුනාගැනීම, පූර්ව පර්යේෂණයන්ගේ ධනාත්මක ලක්ෂණ හා දායකත්වය ඇගයීම, විධිමත් හා ඵලවත් පර්යේෂණ කාර්යයන්හි නිරත වීම හා විධිමත් ශාස්ත්‍රීය ලේඛනයෙහි නිරත වීම යනාදී විෂය කරුණු පිළිබඳ විශේෂ දැනුමක් හා පරිචයක් ලබමින් ඊට අදාළ කුසලතා සංවර්ධනය කර ගනු ඇත.

**පාඨමාලා අන්තර්ගතය :**

***පර්යේෂණයක අන්තර්ගත මූලිකාංග*** ; පර්යේෂණ සැළසුම්, සාහිත්‍ය සමීක්ෂා, පර්යේෂණ තොරතුරු රැස්කිරීම හා විශ්ලේෂණය, පර්යේෂණ සමාලෝචනය, ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රම ශාස්ත්‍රීය රචනය, යාවත්කාලීන ක්‍රමවේද මගින් මූලාශ්‍රය දැක්වීම, ශාස්ත්‍රීය කරුණු

විධිමත් ව විද්වත් ලෝකය වෙත ඉදිරිපත් කිරීම., ***ශාස්ත්‍රීය බෞද්ධ අධ්‍යයන ;*** මානව ශාස්ත්‍ර විෂයයන් පිළිබඳ විධිමත් ශාස්ත්‍රීය අධ්‍යයන හා එහි ඉතිහාසය, පාලි, බෞද්ධ අධ්‍යයන, ඊට අදාළ විෂය ක්ෂේත්‍රයන් හා විෂයයන් පිළිබඳ විධිමත් ශාස්ත්‍රීය අධ්‍යයන හා එම ඉතිහාසය, වත්මන් ලෝකයේ ශාස්ත්‍රීය බෞද්ධ අධ්‍යයන ප්‍රවණතා, ***බුදුසමය පිළිබඳ දාර්ශනික අධ්‍යයන ;*** බෞද්ධ සාහිත්‍යය පිළිබඳ අධ්‍යයනය, පෞරාණික ග්‍රන්ථ සංස්කරණ, පරිවර්තන, කෝෂග්‍රන්ථ සම්පාදනය, ***ශාස්ත්‍රීය රචනය*** ; භාෂාව, තර්කනය, රචනා ශෛලීන්, සූචිය, ආශිත ග්‍රන්ථ නාමාවලිය ආදිය සැකසීම, ***මූලාශ්‍රය දැක්වීමේ ක්‍රම;*** APA, MLA, Chicago / Turabian හා හාවර්ඩ් ක්‍රමය, ශාස්ත්‍රීය පර්යේෂණයන්ට අදාළ සදාචාරාත්මක කරුණු, බෞද්ධ අධ්‍යයනයන් සඳහා වන විදේශීය පර්යේෂණ අවස්ථා

**ඉගැන්වීම් ක්‍රමවේදය** **:** දේශන, සාකච්ඡා හා අභ්‍යාස

**ඇගයීම් ක්‍රමය :** පැවරුම්, ඉදිරිපත් කිරීම් සඳහා 20% ක් ද වර්ෂාවසාන ලිඛිත පරීක්ෂණය සඳහා 80% ක් ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

**නිර්දේශිත කියවීම් :**

1. *Denscombe, Martyn.,* 2010., ***The good research guide : for small-scale social research projects***, 4th ed. : Maidenhead : Open University Press, cop.

2. *Glasman-Deal,* Hilary., 2010., ***Science research writing for non-native speakers of English,*** London ., Imperial College Press.

3. Graziano, A. M., & Raulin, M. L., 1997., Research ***methods: A process of inquiry***., New York., Longman.

4. Mac Nealy, Sue., 1995., ***Strategies for Empirical Research in Writing.,*** Creswell.

5. Michael, A., 2008., ***A Research Primer for Technical Communication: Methods, Exemplars, and Analyses,*** . Hughes & George F., Hayhoe. 40404040

**සංකේතාංකය : MABS 6306W**

**මාතෘකාව : පර්යේෂණ නිබන්ධිකාව**

**අරමුණු හා අභිමතාර්ථ :**

බෞද්ධ අධ්‍යයන විෂය ක්ෂේත්‍රයට අදාළ අනුමත මාතෘකාවක් යටතේ ප්‍රමාණවත් ***(යතුරු ලියනය කරන ලද පිටු 80 ත් 100 ත් අතර විය යුතුය. එසේම වචන 20000 කට නො අඩු විය යුතුය.)*** පර්යේෂණ නිබන්ධයක් රචනා කිරීම අපේක්ෂා කරනු ලැබේ.

**ඉගෙනුම් ඵල :**

මෙම නිබන්ධය සම්පාදන කිරීම තුළින් ශිෂ්‍යයා පර්යේෂණ ක්‍රමවේදයන් හා ශාස්ත්‍රීය අධ්‍යයනයන් සඳහා හුරු වේ. මූලාශ්‍රය භාවිතය පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් ලබා ගනියි. අදාළ විෂය ක්‍ෂෙත්‍රය තුළ ශාස්ත්‍රීය ශික්‍ෂණය ඇති කර ගනියි.

**ඉගැන්වීම් ක්‍රමවේදය :**

පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ දේශන පැවැත්වීම, උපදේශකවරු ඇසුරෙන් අදාළ උපදෙස් සැපයීම, සම්මන්ත්‍රණ පත්‍රිකා ඉදිරිපත් කිරීම.

**ඇගයීම් ක්‍රමය :** සම්මන්ත්‍රණ පත්‍රිකා සඳහා ලකුණු 20% ක් හා පර්යේෂණ නිබන්ධය සඳහා ලකුණු 80% පිරිනැමේ.

**මෙම අත්පොතෙහි සඳහන් ඕනෑ ම කරුණක් පූර්ව දැනුම් දීමකින් තොරව සංශෝධනය කිරීමේ සම්පූර්ණ අයිතිය කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය සතු වේ.**